


විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ දෙවන සමීක්ෂණය

## මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව

2018 ඔක්තෝම්බර්

බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා,
කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්

cepa
centre for poverty analysis

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ දෙවන සමීක්ෂණය

## මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව

2018 ඔක්තෝම්බර්

බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා,
කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2018

පළමු වන මුද්‍රණය - 2018

ISBN: 978-955-3628-39-8

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ සමීක්ෂණය : විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (e-CRC) සොයා ගැනීම් : මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව /

බාසිත් අයිනදීන් ...[සහ තවත් අය]. –
කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2018
පි. 43 ; සෙමී. 29

ISBN 978-955-3628-39-8

i. 352.1607205493 ඩිවි 23 ii බාසිත් අයිනදීන් (සම කර්තෘ)

1. පලාත් පාලනය – ශ්‍රී ලංකාව - පර්යේෂණ

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතුය. මෙම පොතේ යම් කොටසක් ප්‍රති නිෂ්පාදනය කරන්නේ නම් ඊට පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකයාගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ආයතනයේ වර්තමාන ප්‍රකාශන මාලාව සමන්විත වන්නේ මෙම ලියවිලි වලිනි: අධ්‍යයන, සංස්කරණය කරන ලද වෙළුම්, කාර්ය පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා. මෙම අධ්‍යයනයේ ඇතුළත් සොයා ගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කරන ලද්දේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රාජ්‍ය සේවා සම්පාදකයන් හා සේවාලාභීන් විසිනි. මෙම අධ්‍යයනය CEPA ආයතනයේ හෝ ආධාර දෙන ආයතනයේ අදහස් හෝ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම් පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතුය:

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 (011) 46902200, 2676955 වෙබ් අඩවිය
විද්‍යුත් තැපැල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

මෙම ප්‍රකාශනය සම්පාදනය කරන ලද්දේ යුරෝපා සංගමයේ සහාය ඇතිව ය. මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය සම්බන්ද වගකීම සම්පූර්ණයෙන් ම CEPA ආයතනය විසින් දරනු ලබන අතර යුරෝපා සංගමයේ ස්ථාවරය පිළිබිඹු කරන්නක් ලෙස කිසි සේත් ම සැලකිය නොහැකි ය.

# කතුවරු

## බාසිත් අයිනදීන්

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේ ය. බාසිත් බහුපාර්ශ්වීය ක්‍රියාවලි හා සමාජ ඉගෙනුම් සම්බන්ධයෙන් නෙදර්ලන්තයේ වාහනින්ගන් විශ්වවිද්‍යාලයේ ද සමාජ වග වීමේ මෙවලම්, විශේෂයෙන් ම පුරවැසි වාර්තාපත් ක්‍රමවේදය සම්බන්ධයෙන් ඉන්දියාවේ බැංගලෝරයේ මහජන කටයුතු මධ්‍යස්ථානයේ ද ජාත්‍යන්තර බලපත්‍ර ලාභියෙකි. ක්‍රියාකාරකම් හා ව්‍යවහාරික පර්යේෂණ පිළිබඳ සිය විශේෂඥතාව දායක කරමින් CEPA ආයතනයේ දී බාසිත් නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින ඔහු සමාජ වග වීමේ යන්ත්‍රණයන් පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද ඔහු මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. මේ වන විට ඔහු CEPA ආයතනයේ පුරවැසි වාර්තා පත් යහපාලන මෙවලම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරමින් සිටී.

## ඉසුරු තෙන්නකෝන්

CEPA ආයතනයේ කනිෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකු ලෙස කටයුතු කරයි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව, ආර්ථික ප්‍රතිපත්තිය හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති ඔහු මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයෙහි ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලොමා පාඨමාලාවක් හදාරමින් සිටී. උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු ද වන ඔහු, උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. කවියෙකු වන ඉසුරු මේ වන විට කවි පොත් තුනක් පළ කර ඇත. මීට පෙර ඔහු ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයෙකු හා පර්යේෂණ සහායකයෙකු ලෙස ලාභ නොලබන සංවිධාන සමග කටයුතු කර ඇත. CEPA ආයතනයේ දී ඉසුරු කටයුතු කරන්නේ තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයක් වන දරිද්‍රතාවේ පැතිකඩවල් සම්බන්ධයෙන් සහ සන්නිවේදන කණ්ඩායම සමග ය. මේ වන විට ඔහු පුරවැසි වාර්තාපත පිළිබඳව අවධානය යොමු කරන අධ්‍යයනයක නිරතව සිටින අතර මොණරාගල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කාර්යය භාරව කටයුතු කරයි.

## මේහලා මහිල්රාජා

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන භාවිතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ (SLEvA) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයෙහි (NILS) නිරීක්ෂණය හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර ඇත. CEPA ආයතනයේ දී මේහලා නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. ඇය ක්‍රියාකාරකම් පර්යේෂණ සම්බන්ධයෙන් තමන් සතු විශේෂඥතාව පර්යේෂණ කටයුතුවලට එක් කරයි. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින මේහලා සමාජ වග වීමේ යන්ත්‍රණයන්, විශේෂයෙන් ම 'පුරවැසි වාර්තා පත්' මෙවලම, පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. ඇය වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද දායක වී ඇත.

## කුලසබානාදන් රොමේෂන්

CEPA ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙක් ද කළමණාකරන කණ්ඩායමේ සාමාජිකයෙක් ද වේ. පසු ගිය විසි වසර තුළ ඔහු රජය හා අරමුදල් සපයන සංවිධාන සමග එක්ව සංවර්ධන ක්ෂේත්‍රයෙහි කටයුතු කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

දරිද්‍රතාවේ පැතිකඩවල් වැඩසටහනේ කණ්ඩායම් නායකයෙකු වන රොමේෂ් සහ ඔහුගේ කණ්ඩායම CEPA ආයතනයේ පර්යේෂණ හා උපදේශන ක්‍රියාකාරකම් පදනම් කර ගෙන දරිද්‍රතාව, අසමානතාව හා සමෘද්ධිය පිළිබඳ පණිවුඩ සසඳා බැලීම සම්බන්ධයෙන් වගකීම දරති. දරිද්‍රතාවේ පැතිකඩවල් කණ්ඩායම දරිද්‍රතාමානය පිළිබඳ කටයුතුවල ද නිරතව සිටින අතර දරිද්‍රතාවට සාර්ව සාධක කරන බලපෑම විමසා බැලීම සඳහා ද මුල පුරමින් සිටියි.

## හසන්ති තෙන්නකෝන්

ටැස්මේනියා විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර සමායතනික ස්ථාවර භාවය සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබා ඇත. ඇයගේ අවධානය යොමු වන්නේ පාරිසරික තිරසර භාවය හා සමාජීය තිරසර භාවය යන ක්ෂේත්‍ර කෙරෙහි ය. මේ වන විට ඇය CEPA ආයතනයේ පර්යේෂණ උපදේශකවරයෙකු ලෙස මෙන් ම ලෝක බැංකුවේ සමාජ ආරක්ෂණ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කරයි.

## දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් කිරීමට කටයුතු කරන ස්වාධීන, ශ්‍රී ලාංකික බුද්ධිමතුන් කණ්ඩායමක එකතුවකි. දරිද්‍රතාව යනු වහා විසඳුම් සෙවිය යුතු සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අසාධාරණයන් සිදුවන්නක් බව අපගේ අවබෝධයයි. දරිද්‍රතාව සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීමට නම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනස් විය යුතු බව හා දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා සමග එක්ව වැඩ කළ යුතු බවට CEPA ආයතනය විශ්වාස කරයි. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් හා ව්‍යාපෘති වල දී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා දායක වීමට CEPA ආයතනය ප්‍රමුඛත්වය ලබා දේ. CEPA ආයතනය ලෙස අප අවධානය යොමු කරන්නේ ස්වාධීන විශ්ලේෂණ ඉදිරිපත් කිරීම, සංවර්ධන ක්‍රියාවලියට දායක වන්නන්ගේ හැකියාවන් වර්ධනය සහ ප්‍රතිපත්තිමය බලපෑම් කළ හැකි අවස්ථා සොයා බලා ඊට මැදිහත් වීම කෙරෙහිය. වඩා විශ්වසනීය අනුභූතික සාක්ෂි පදනම් කර ගෙන සමාජීය අවශ්‍යතාවයන් හඳුනාගෙන සේවාවන් සැපයීමට අප ආයතනය කටයුතු කරනු ලබයි. CEPA ආයතනය සේවාදායකයන්ගේ ඉල්ලීම් අනුව සුදුසු බුද්ධිමය හා තාක්ෂණික සේවාවන් ලබා දීම මෙන්ම පශ්චාත් ගැටුම් සංවර්ධනය, අවදානමට ලක් වීමට තිබෙන ඉඩකඩ, සංක්‍රමණය, යටිතල පහසුකම් හා පරිසරය වැනි පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර පහක් පදනම් කර ගෙන කාලීන වැදගත්කමකින් යුත් පර්යේෂණවල ද නිරත වේ.

# ස්තුතිය

මෙම අධ්‍යයනයට සහාය දීම සම්බන්ධයෙන් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යුරෝපා සංගමයට සිය ස්තුතිය පුද කර සිටී. අධ්‍යයනය සඳහා මුල පුරන ලද්දේ CEPA ආයතනය ACTED ආයතනයේ හවුල්කාරිත්වය ඇතිව ක්‍රියාත්මක කරන *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* පිළිබඳ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ය. පුරවැසි වාර්තාපත් සමීක්ෂණය සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී CEPA ආයතනය මූලිකත්වය ගත්තේ ය.

මෙම අධ්‍යයනය සිදු කළ හැකි වූයේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන්, සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් (ACLGs), ප්‍රාදේශීය සභා ලේකම්වරුන් සහ මුලතිවු, මඩකලපුව හා මොණරාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් විසින් අපට ලබා දෙන ලද සහාය නිසයි.

CEPA ආයතනය මොණරාගල දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සංවිධානවලට ද සිය ස්තුතිය පළ කර සිටී.

| අනුක්‍රමික අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම | සිවිල් සමාජ සංවිධානයේ නම |
|---|---|---|---|
| 1 | බඩල්කුඹුර | දේවතුර | එකමුතු ගොවි සංවිධානය |
| 2 | බඩල්කුඹුර | ඇල්ල | සරණ සුභසාධක සංගමය |
| 3 | බඩල්කුඹුර | මාළිගාතැන්න | දිලෙනතරු කාන්තා සංවිධානය |
| 4 | බඩල්කුඹුර | ලුණුගල ජනපදය | අරුණ ග්‍රාම සංවර්ධන සමිතිය |
| 5 | මඩුල්ල | පඟුර | ශ්‍රී ප්‍රඥාසේකර සමගි සුභසාධන සමිතිය |
| 6 | මඩුල්ල | නාමල්ඔය ජනපදය | නාමල්ඔය ජනපදය ග්‍රාමීය සමිතිය |
| 7 | මඩුල්ල | පංගුව | ළහිරු ගොවි සංවිධානය |
| 8 | මඩුල්ල | තල්කොටයාය | සමෘද්ධි ග්‍රාමීය සමිතිය |
| 9 | මඩුල්ල | මාගන්දාඔය ජනපදය | ප්‍රගති ගොවි සංවිධානය |
| 10 | මඩුල්ල | කොල්ලදෙණිය | දිනිඳු ගොවි සංවිධානය |
| 11 | මඩුල්ල | රිටිගහවත්ත | අසරණ සරණ මරණාධාර |
| 12 | මැදගම | බිබිලමුල්ල | දීප්ති කාන්තා සංවිධානය |
| 13 | මැදගම | ඇල්හේන | නවහිරු ළමා සමාජය |
| 14 | මැදගම | කොටබෝව | අලුත්වෙල එකමුතු පරිසර සාමාජිකයන්ගේ සමාජ සුභසාධන සමිතිය |
| 15 | මැදගම | බැඳියාව | බැඳියාව තිරසර සහයෝගිතා පදනම |
| 16 | මැදගම | පිටදෙණිය | සමෘද්ධි ග්‍රාමීය සමිතිය |
| 17 | මැදගම | මැල්ලගම | මැල්ලගම ග්‍රාම සංවර්ධන සමිතිය |
| 18 | මැදගම | රත්තණදෙණිය | වැවුමඩ එකමුතු සුභසාධන මරණාධාර සමිතිය |

මෙම කාර්ය සාර්ථක කර ගැනීමට සිය සහයෝගය දැක්වීම පිළිබඳව ආයතනය විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ සියලු සිවිල් සංවිධාන වලට ස්තුතිය පිරි නමන අතර මෙම අධ්‍යයනය සාර්ථක කිරීම සඳහා තොරතුරු සම්පාදනය කරමින් දෙමව්පියන් හා සිසුන් ලබා දුන් අගනා දායකත්වය වෙනුවෙන් ද CEPA ආයතනය සිය කෘතඥතාව පළ කර සිටී. මෙම අධ්‍යයනයේදී දත්ත සමික්ෂකයන්ට මග පෙන්වමින් ඔවුන් සමග කටයුතු කරමින්, අනුෂා සිවලිංගම් හා ෂෙහානා මිර්සා යන  ආයතන පර්යේශිකාවන් විසින් දක්වන ලද සහයෝගය වෙනුවෙන් ඔවුනට ද අප ස්තුතිය මෙහිදී හිමි වේ.

# කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| ACLG | සහකාර පළාත් පාලන කොමසාරිස් |
| EU | යුරෝපා සංගමය |
| CEPA | දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| CSO | සිවිල් සමාජ සංවිධානය |
| CRC | පුරවැසි වාර්තාපත |
| eCRC | විද්‍යුත් පුරවැසි වාර්තාපත |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DDE | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ |
| GNDs | ග්‍රාම නිලධාරි වසම් |
| PS | ප්‍රාදේශීය සභාව |
| WRDS | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| RDS | ග්‍රාම සංවර්ධන සමිතිය |

# රූප සටහන් මාලාව


1 වැනි රූප සටහන : ජලය පැවතීම හා භාවිතය ....................................................................9
2 වැනි රූප සටහන : මාර්ග හා අතුරු මාර්ග පැවතීම හා භාවිතය ..........................................10
3 වැනි රූප සටහන : වීදි ලාම්පු පැවතීම .........................................................................10
4 වැනි රූප සටහන : කසළ එක්රැස් කිරීමේ සේවාවන් පැවතීම හා භාවිතය ..........................11
5 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පැවතීම හා භාවිතය..............................................12
6 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පැවතීම හා භාවිතය............................................12
7 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පැවතීම හා භාවිතය ............................................13
8 වැනි රූප සටහන : ජල සම්පාදන සේවාවන් පිළිබඳ තෘප්තිය ............................................14
9 වැනි රූප සටහන : මාර්ග පිළිබඳ තෘප්තිය.....................................................................14
10 වැනි රූප සටහන : වීදි ආලෝකය පිළිබඳ තෘප්තිය...........................................................15
11 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පිළිබඳ තෘප්තිය .................................................15
12 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පිළිබඳ තෘප්තිය ...............................................16
13 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පිළිබඳ තෘප්තිය.................................................16
14 වැනි රූප සටහන : සේවාවන් ලබා ගන්නා විට දැරීමට සිදු වන සැඟවුණු වියදම්...................17
15 වැනි රූප සටහන : පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ තෘප්තිය..................18
16 වැනි රූප සටහන : සේවාවන් පිළිබඳ තෘප්තිය ආශ්‍රිත ශ්‍රේණිගත කිරීම් ..................................20
17 වැනි රූප සටහන : ප්‍රාදේශීය සභාවන්ගේ වහා ම අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා සේවා...................21
18 වැනි රූප සටහන : බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු සේවා අංශ...............22
19 වැනි රූප සටහන : මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු සේවා අංශ ..................22
20 වන රූප සටහන : මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු සේවා අංශ.....................23

# අන්තර්ගතය

1. හැඳින්වීම ..... 1

1.1. ව්‍යාපෘතිය..... 1

1.2. වාර්තාවේ විෂය පථය ..... 1

1.3. අධ්‍යයනයේ අරමුණු ..... 2

1.4. නියැදිකරණය ..... 2

1.5. ක්‍රමවේදය..... 4

1.5.1. පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද?..... 4

1.5.2. විද්‍යුත් පුරවැසි වාර්තා පතක් (eCRC) යනු කුමක් ද? ..... 5

1.5.3. විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම..... 5

1.5.4. විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුතු සේවාවන් හඳුනා ගැනීම ..... 6

1.5.5. කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම..... 6

1.6. අධ්‍යයන ප්‍රදේශය ..... 7

2. ප්‍රධාන සොයා ගැනීම් ..... 9

2.1. සේවා ලබා ගැනීම, ප්‍රවේශය හා භාවිතය..... 9

2.2. සේවාවන් පිළිබඳ සමස්ත තෘප්තිය ..... 13

2.3. සැඟවුණු වියදම් ..... 17

2.3.1. සේවා සඳහා දරන ලද වියදම ..... 17

2.3.2. පැමිණිලි /දුක් ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීම ..... 18

3. සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය ..... 19

4. නිර්දේශ ..... 21

4.1. වැඩි දියුණු කළ යුතු සේවා අංශ..... 21

4.1.1. වහා ම අවධානය යොමු කළ යුතු අංශ..... 21

4.1.2. වෙනත් සළකා බැලීම් ..... 23

4.2. ඉදිරි මාවත..... 24

# 1. හැඳින්වීම

## 1.1. ව්‍යාපෘතිය

යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* ව්‍යාපෘතියේ අභිමතාර්ථය වන්නේ වඩාත් හොඳ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම හා රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ආයතන සමග සහයෝගී වීමට සිවිල් සමාජ සංවිධාන (CSOs) සතු හැකියාව ශක්තිමත් කිරීම, වැඩි දියුණු කිරීම සහ ඒ අතර සේවා සම්පාදකයන්ගේ වග වීම සහතික කිරීම යි. ACTED ආයතනය සහ CEPA ආයතනය පහත දැක්වෙන ව්‍යාපෘති ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගීව කටයුතු කරමින් සිටී. 2018 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසයන්හි දී මොණරාගල, මඩකලපුව හා මුලතිවු දිස්ත්‍රික්ක වල මෙම අධ්‍යයනයේ පාදක සමීක්ෂණය සිදු කරනු ලැබූ අතර, මෙම ප්‍රගති සමීක්ෂණය සඳහා වන දෙවන සමීක්ෂණය 2018 වසරේ සැප්තැම්බර් මාසයේදී සිදු කරන ලද්දේ පළාත්පාලන ආයතන වල සිදු වූ ප්‍රගතිය විමසා බැලීමේ අපේක්ෂාවෙනි.

පහත දැක්වෙන ප්‍රතිඵල (R1 සහ R2) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය ACTED ආයතනයට පැවරී ඇත.

- R1 - සිවිල් සමාජ සංවිධානවලට සිය විධි නියෝගයන් ක්‍රියාත්මක කිරීමට තිබෙන හැකියාව සහ ප්‍රාදේශීය සමාජ සංවර්ධන ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව නිරත වීමට තිබෙන හැකියාව වැඩි දියුණු කෙරේ.
- R2 - සහභාගීත්ව බහුපාර්ශ්වීය ප්‍රවේශයක් මගින් සමාජ සේවාවන් ආශ්‍රිත ප්‍රාදේශීය අවශ්‍යතා හා අඩුපාඩුකම් හඳුනා ගැනෙන අතර සිවිල් සමාජ සංවිධාන සහ රජයේ ආයතන විසින් විසඳුම් ලබා දීමට කටයුතු කෙරේ.

පහත දැක්වෙන ප්‍රතිඵලය (R3) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය CEPA ආයතනයට පැවරී ඇත.

- R3 - සේවා සම්පාදකයන් ලවා වඩාත් හොඳින් වග වීම සඳහා සමාජ සේවා සම්පාදනය/ඒවායේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම වැඩි කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කෙරෙන අතර ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම සඳහා යහභාවිතයන් ප්‍රචලිත කෙරේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස CEPA ආයතනය ක්‍රියාකාරකම් ගණනාවකට මුල පිරිය යුතු අතර ඒවා පහත දැක්වේ:

- විවිධ මට්ටම්වල රාජ්‍ය සේවා සම්පාදකයන් හඳුනා ගැනීම,
- ඉලක්ක කෙරෙන සිවිල් සමාජ සංවිධානවලින් සංගණනකරුවන් තෝරා ගැනීම,
- සංගණනකරුවන්ට පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් ලබා දීම,
- ප්‍රශ්නාවලි සකස් කිරීමට හා දත්ත රැස් කිරීමට පහසුකම් සැපයීම,
- ප්‍රතිඵල රජයේ ආයතන වෙත යොමු කිරීම සහ සේවාවන් ආශ්‍රිත අඩුපාඩුකම් සපුරාලීම සඳහා සැලසුම් සකස් කිරීමට ඒවාට සහාය වීම.

## 1.2. වාර්තාවේ විෂය පථය

මෙම වාර්තාව මගින් **මොණරාගල දිස්ත්‍රික්කයේ** තෝරාගත් ග්‍රාමනිලධාරී වසම් ඇසුරෙන් **ප්‍රාදේශීය සභා සේවා සැපයීම** පිළිබඳව සොයා ගැනීම් ඉදිරිපත් කරනු ලැබේ. මෙම සමීක්ෂණය 2018 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසයන් වල දී කරන ලද පළමු සමීක්ෂණයෙන් පසු 2018 සැප්තැම්බර් මාසයේ කරන ලද දෙවැනි සමීක්ෂණය වන අතර සමීක්ෂණය ඇසුරෙන් ආවරණය කරන ලද්දේ දී මෙම අධ්‍යයනය **බඩල්කුඹුර මැදගම හා මඩුල්ල** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ග්‍රාම සේවා වසම් වේ.

## 1.3. අධ්‍යයනයේ අරමුණු

අධ්‍යයනයේ විශේෂිත අරමුණු මෙසේ වේ:

(i) රාජ්‍ය සේවාවන් වෙත පවත්නා ප්‍රවේශය, ඒවායේ ගුණාත්මක බව හා එම සේවාවන් සැබවින් පරිහරණය කරන්නන්ගේ තෘප්තිය තක්සේරු කිරීමේ මෙවලමක් ලෙස සහ සමාජීය වගවීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත යොදා ගැනීම,

(ii) මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ක්‍රියාකාරීව ප්‍රචලිත කිරීම සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ඉටු කර ගැනීම සඳහා ඒවා යොදා ගැනීම,

(iii) වෙනත් දිස්ත්‍රික්කවල වෙනත් රාජ්‍ය ආයතන තුළ මීට සමාන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා සැබෑ පරිහරණය කරන්නන්ගේ මෙම අත්දැකීම ඉදිරිපත් කිරීම.

## 1.4. නියැදිකරණය

විද්‍යුත් පුරවැසි වාර්තාපත ප්‍රධාන වශයෙන් සේවාවන් දෙවර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරිණ. එකක් ද්විතීය නිදහස් අධ්‍යාපනය ද අනෙක ප්‍රාදේශීය සභා විසින් සැපයෙන සේවා ද විය. විද්‍යුත් පුරවැසි වාර්තාපත ACTED ආයතනය විසින් මුලතිවු, මඩකලපුව හා මොණරාගල දිස්ත්‍රික්කවලින් තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි වසම් 60ක් ආවරණය කළේය. සමීක්ෂණය සඳහා යොදා ගැනුණු නියැදියේ විශාලත්වය තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 60න් කුටුම්බ 1,200ක් නොහොත් ඒ ඒ දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20න් කුටුම්බ 400ක් විය යුතු යැයි තීරණය කෙරිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් 20න් තෝරා ගැනුණු කුටුම්බ 400 අනතුරුව ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ සැබෑ සේවාලාභීන් සංඛ්‍යාව අනුව බෙදා වෙන් කරන ලදි.


මඩකලපුව, මුලතිවු හා මොණරාගල යන දිස්ත්‍රික්ක තුනේ දී ම නියැදිකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලද්දේ අදියර ගණනාවකිනි. පළමු අදියරේ දී ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා කුටුම්බ පිළිබඳ දත්ත පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් විසින් පාසල් යන වයසේ (5 සිට 13 ශ්‍රේණිය දක්වා) දරුවන් සිටින කුටුම්බ හඳුනා ගෙන ලැයිස්තුගත කෙරිණ. සමීක්ෂණය සඳහා යොදාගත් කුටුම්බ නියැදිය ඒ ඒ ග්‍රාම නිලධාරි වසමෙන් අපේක්ෂිත නියැදියේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් අහඹු ලෙස තෝරා ගැනිණ. මේ අතර ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ සමීක්ෂණය සඳහා තෝරා ගත් නියැදිය ද මෙම කුටුම්බ යටත් පිරිසෙයින් ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන එක් රාජ්‍ය සේවාවක්වත් භාවිත කරන්නේය යන නිර්ණායකය පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ ක්‍රියාකාරී සිවිල් සමාජ සංවිධාන විසින් හඳුනා ගැනුණු ඉහත සඳහන් කරන ලද කුටුම්බ අතරින්ම තෝරා ගැනිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ නියැදිකරණ ක්‍රියාවලිය සඳහා මුල පුරන ලද්දේ කුටුම්බ අනුපාතයන් සහ ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා සියලු ගම්මාන නියෝජනය වන පරිදි වඩාත් පුළුල් ආවරණයක් සාක්ෂාත් කර ගත යුතු බව සිත තබා ගනිමිනි. සමස්තයක් ලෙස ගත් කල විද්‍යුත් පුරවැසි වාර්තාපත සඳහා කුටුම්බ 1,200ක් (මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 400ක්, මොණරාගල දිස්ත්‍රික්කයෙන් 400ක් සහ මුලතිවු දිස්ත්‍රික්කයෙන් 400ක්) සම්බන්ධ කර ගැනිණ. ගුණාත්මකබව පිළිබඳ සියලු පරීක්ෂාවන්ගෙන් පසුව විශ්ලේෂණය සඳහා ඒ අතරින් තෝරා ගැනුණු වලංගු නියැදිය තුළින් දිස්ත්‍රික්ක තුනේ ග්‍රාම නිලධාරි වසම් 60 ආවරණය විය.

නියැදියට අදාළව අවශ්‍ය සියලුම කුටුම්බයන් මෙම දෙවන සමීක්ෂණය යටතේ ආවරණය කරන ලදී. කෙසේ වෙතත් මීට පෙර සමීක්ෂණය කරන ලද නිවසටම ගොස් තොරතුරු ගැනීම අත්‍යවශ්‍ය නොවන අතර පළමු සමීක්ෂණයේ දී ඇතැමුන් අධ්‍යයනයට භාජනය නොවී තිබුණද, අධ්‍යනයට බඳුන් කරන ලද ප්‍රදේශයේ පවුල් වලින් ලැබුණු සියලුම ප්‍රතිචාර හා එම සේවාන්ගේ යථා තත්වයන් පිළිබඳ සපයන ලද පිළිතුරු මෙම සියලුම ප්‍රදේශයන් හි සේවා සැපයුමට හා ඒවායේ ගුණාත්මක බවට අදාළ වේ.

නියැදිකරණයට මුල පුරන ලද්දේ පහත දැක්වෙන නියැදිකරණ ආකෘතිය පදනම් කර ගෙන ය.

| ජනගහනය (කුටුම්බ) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 95%) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 90%) |
|---|---|---|
| 100 | 80 | 66 |
| 500 | 217 | 141 |
| 1,000 | 278 | 164 |
| 5,000 | 357 | 189 |
| 10,000 | 370 | 192 |
| 30,000 | 379 | 195 |
| 50,000 | 381 | 195 |
| 100,000 | 383 | 196 |
| 200,000 | 383 | 196 |

නියැදිකරණ ක්‍රියාවලිය සඳහා පහත දැක්වෙන ඡායාරූපය වැනි චන්ද්‍රිකා ඡායාරූප යොදා ගන්නා ලද අතර, ඒ ඔස්සේ මොණරාගල දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කරන ලද ප්‍රදේශ පහත චන්ද්‍රිකා ඡායාරූපය ඇසුරින් හඳුනාගත හැකිය.



# 1.5. ක්‍රමවේදය

## 1.5.1. පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද?

පුරවැසි වාර්තාපත (CRC) යනු රාජ්‍ය සේවාවන්ගේ කාර්ය සාධනය පිළිබඳව ක්‍රමානුකූල සහ සැබවින් පරිහරණය කරන්නන්ගේ ප්‍රතිචාර ලබා ගතහැකි සරල නමුත් බලගතු මෙවලමකි. එය සැබවින් පරිහරණය කරන්නන්ගෙන් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව හා ප්‍රමාණවත් බව පිළිබඳ ප්‍රතිචාර රැස් කර ගන්නා සහභාගිත්ව සමීක්ෂණයකි. පුරවැසි වාර්තාපත සේවා සම්පාදකයන් සමඟ සංවාදයක යෙදීමට සහ රාජ්‍ය සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඔවුන් ලවා වග වීමට ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන හෝ පළාත් පාලන ආයතන වෙත තර්කානුකූල පදනමක් හා ප්‍රායෝගික ප්‍රවේශයක් සම්පාදනය කරයි. පුරවැසි වාර්තාපත මුලින් ක්‍රියාත්මක කෙරුණේ නාගරික පරිසරයන් තුළ වුවත් දැන් එය රාජ්‍ය සේවා සම්පාදනයේ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා භූගෝලීය පසුබිම් සහ ආංශික වාතාවරණයන් ගණනාවක දී ම යොදා ගැනේ.

පුරවැසි වාර්තාපත ප්‍රතිලාභ ගණනාවක් අත් කර දෙයි. තමන් සම්පාදනය කරන රාජ්‍ය සේවාවන් මහජනයා වෙත විශේෂයෙන් ම ප්‍රජාව තුළ සිටින වඩාත් අප්‍රමාණවත් ලෙස සේවාවන් සම්පාදනය කෙරෙන සාමාජිකයන් වෙත ළඟා වන්නේ දැයි සොයා ගැනීමේ පිරිවැය ඵලදායක ක්‍රමයක් එය සේවා සම්පාදකයන් වෙත පිරිනමයි. එමෙන් ම එය තමන්ට ලැබෙන සේවාවන්ගේ ගුණාත්මක බව, කාර්යක්ෂමතාව හා ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් ප්‍රතිචාර සහ සේවා සම්පාදකයන් සමග ගනුදෙනු කරන විට තමන් මුහුණ දෙන ප්‍රශ්න පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන් වෙත පිරිනමයි. විවිධ සේවා සම්පාදකයන් සිටින ප්‍රදේශවල දී විවිධ සේවාවන් සම්බන්ධයෙන් පරිහරණය කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම් සසඳා බැලීමට හැකියාව ලැබේ. මෙලෙස (පරිහරණය කරන්නන්ගේ තෘප්තිය පදනම් කර ගෙන) සිදු වන තක්සේරුව අනතුරුව යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් සේවා සම්පාදකයන්ගේ කාර්ය සාධනය මැන බැලිය හැකි 'වාර්තාපතක්' බවට පත් වේ. පුරවැසි වාර්තාපතෙන් පිළිබිඹු වන්නේ රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන්ගේ සැබෑ අත්දැකීම් නිසා පුරවැසි වාර්තාපත රාජ්‍ය සේවාවන් පිළිබඳව කෙරෙන මත විමසුම් සමග පටලවා නොගත යුතු ය. උදාහරණයක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගන්නා සමීක්ෂණවල දී ඉලක්ක කර ගැනෙන්නේ යම් යම් සේවාවන් භාවිත කර ඇති සහ/හෝ අදාළ රාජ්‍ය ආයතන සමග ගනුදෙනු කර ඇති පුද්ගලයන් පමණකි.

රටවල් 20කට වැඩි ගණනක දී ප්‍රාදේශීය හා ජාතික ආණ්ඩු සහ සිවිල් සමාජ සංවිධානවල පටන් සංවර්ධන හවුල්කරුවන් දක්වා වූ විවිධ ආයතන විසින් පුරවැසියන් සම්බන්ධ කර ගැනීමේ හා සේවාවන් වැඩි දියුණු කිරීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගනු ලැබ ඇත. මෙම මෙවලම සාමාන්‍යයෙන් දත්ත උත්පාදනය කරන්නේ පුරවැසියන් සහ ආණ්ඩුව එකිනෙකාට හමු වන තැන දී නිසා බොහෝ බලපෑම් ක්ෂේත්‍රවල දී එය ප්‍රයෝජනයට ගත හැකි ය. උදාහරණයක් ලෙස එයට රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් පෝෂණය කිරීමේ, පාලන ක්‍රියාවලි හා සේවා සම්පාදන යන්ත්‍රණයන් නැවත සකස් කිරීමේ සහ රාජ්‍ය හා ප්‍රජා ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ පදනම බවට පත් විය හැකි ය.

පුරවැසි වාර්තාපතේ එක් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ හඬක් නොනැගෙන ප්‍රජාවන්ට සිය අදහස් පළ කිරීම සඳහා ඉඩක් සලසා දීමට ඊට තිබෙන හැකියාව යි. මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල පිහිටි ඉතා දුර බැහැර හා ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදු නොවන ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ මෙම සුවිශේෂ අධ්‍යයනයේ දී සිදු වූයේ එය යි. අභිමතාර්ථය වූයේ තෝරා ගැනීම් තමන් විසින් ම කරනු ලැබීම සඳහා, තම අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සහ ආත්ම විශ්වාසයෙන් යුතුව තිරසර ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රජාවන් බල ගැන්වීම යි. මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා CEPA ආයතනය ප්‍රජා පාදක පර්යේෂණ ඔස්සේ හඳුනා ගැනුණු ප්‍රමුඛතාව දෙන ලද සේවාවන් තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය. අරමුණ වූයේ දුප්පතුන්ට හිතැති සහ අයිතිවාසිකම් පදනම් කර ගත් දැක්මකින් යුතුව දැනට පවත්නා භාවිතයන්ට හා ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම යි.

## 1.5.2. විද්‍යුත් පුරවැසි වාර්තා පතක් (eCRC) යනු කුමක් ද?

විද්‍යුත් පුරවැසි වාර්තාපත (eCRC) යනු නවීන තාක්ෂණයේ බලය හා පහසුව ප්‍රයෝජනයට ගනිමින් පුරවැසි වාර්තාපත් ක්‍රියාත්මක කිරීමේ විප්ලවීය ප්‍රවේශයකි. විද්‍යුත් පුරවැසි වාර්තාපත ඇන්ඩ්‍රොයිඩ් මෙහෙයුම් පද්ධතිය පදනම් කර ගත් ජංගම දුරකථන මෘදුකාංග යෙදවුමක් මගින් විශ්වසනීය ආකාරයෙන් පුරවැසි ප්‍රතිචාර රැස් කිරීමටත් රැස් කර ගත් තොරතුරු ඒ මොහොතේ ම විශ්ලේෂණය කිරීමට හා වාර්තා කිරීමටත් හැකියාව ලබා දෙයි. විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය අංග කිහිපයකින් සමන්විත වේ:

#### (a) සමීක්ෂණය පැවැත්වීම

ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් යොදා ගනිමින් ටැබ්ලට් පරිගණකයක් ඔස්සේ මහජන ප්‍රතිචාර හා අත්දැකීම් පිළිබඳ විද්‍යාත්මක නියැදි සමීක්ෂණයක් පවත්වනු ලැබේ. ජංගම දුරකථන/ටැබ්ලට් පරිගණකවල පවත්නා GPS සෙවුම් පද්ධතිය දත්ත රැස් කරගත් ස්ථානය පෙන්නුම් කරන නිසා දත්ත රැස් කිරීමේ විශ්වසනීයත්වය වැඩි දියුණු වේ.

#### (b) තත්ත්ව පාලනය සඳහා දුරස්ථ නිරීක්ෂණය

වෙබ් ජාලය පදනම් කර ගත් සමීක්ෂණ කළමනාකරන මොඩියුලය ඒ මොහොතේ ම සමීක්ෂණයේ ප්‍රගතිය සොයා බැලීමට සමීක්ෂණ කළමනාකරුවන්ට හැකියාව ලබා දෙයි. මෙම මොඩියුලය දුරස්ථ නිරීක්ෂණයට සහ සමීක්ෂණ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට හැකියාව ලබා දෙන අතර එම නිසා වැඩි තත්ත්ව පාලනයක් කළ හැකි බව සහතික කරයි.

#### (c) දත්ත විශ්ලේෂණය

විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලියේ කොටසක් ලෙස නිර්මාණය කරන ලද ඔන්ලයින් මෙවලම් පුවරුව හා දත්ත විශ්ලේෂණ මෙවලම් විවිධ පාර්ශ්වකරු කණ්ඩායම්වල (උදා. ප්‍රතිපත්ති සම්පාදකයන්, පරිපාලකයන්, දේශපාලන නියෝජිතයන් හා පුරවැසියන් යනාදි) තොරතුරු අවශ්‍යතා සපුරයි. සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරිපත් කෙරෙන්නේ පහසුවෙන් අවබෝධ කර ගත හැකි ප්‍රස්තාර, වගු හා සිතියම් මගිනි. කාර්ය සාධන මට්ටම් පහසුවෙන් නිගමනය කිරීමට පහසුකම් සැපයීම සඳහා සරල වර්ණ සංකේත යොදා ගනු ලැබේ.

විද්‍යුත් පුරවැසි වාර්තාපත වාර්තාකරණය සඳහා ටැබ්ලට් පරිගණක හා නවීනතම තාක්ෂණය යොදා ගන්නා නිසා එහි වාසි කිහිපයක් පවතී.

- එය ඉතා නිවැරදි දත්ත උත්පාදනය කරයි.
- ක්ෂණික ප්‍රතිඵල ලබා දෙයි.
- සමීක්ෂණය පැවැත්වෙන භූගෝලීය ස්ථානයේ සිතියමක් මත දත්ත/ප්‍රතිඵල විදහා දැක්වීමට හැකියාව ලබා දෙයි.
- එක් වරක් ආයෝජන පිරිවැය දරා ක්‍රියාකාරකම නැවත නැවතත් කිරීමට ඉඩ සලසා දෙන නිසා එය වඩාත් පිරිවැය ඵලදායක ය.

## 1.5.3. විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම

මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය පිණිස මඩකලපුව, මොණරාගල හා මුලතිවු යන ඒ ඒ දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20ක විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය පැවැත්වීමට සැලසුම් කරනු ලැබිණ. සමීක්ෂණය සැලසුම් කරන ලද්දේ අධ්‍යයනය සඳහා හඳුනා ගත් ප්‍රදේශවල ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය සහ ද්විතීය අධ්‍යාපන සේවාවන්හි තත්ත්වය ආවරණය කිරීම සඳහා ය. සමීක්ෂණයේ කාල සීමාව සහ අනෙක් කාර්ය සම්පාදන කටයුතු පිළිබඳව අවසන් තීරණයකට එළඹුණේ අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ගෙන් උපදෙස් ලබා ගනිමිනි. සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන (CSO) කණ්ඩායමක් විසිනි. දිස්ත්‍රික්ක තුන තුළ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා CEPA ආයතනයේ පර්යේෂකයන්ගේ සහ ACTED ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ CEPA

ආයතනය විසින් සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් කණ්ඩායම සම්පත් පුද්ගල සංචිතයක් ලෙස පුහුණු කරන ලදි.

## 1.5.4. විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුතු සේවාවන් හඳුනා ගැනීම

ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් සමග පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (FGDs) අතරතුර දී ගැටලු සහිත වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස ඉස්මතු වූයේ (i) ප්‍රාදේශීය සභා සේවා සහ (ii) ද්විතීය අධ්‍යාපන සේවා (5 වසර-13 වසර) සම්පාදනය යි. මෙම ප්‍රමුඛතා ACTED ග්‍රාම සංවර්ධන සැලසුම්වල (VDPs) විස්තර කර ඇති ප්‍රමුඛතාවන් සමඟ ද ගැළපේ.

තීරණාත්මක සේවාවන් වැඩි දියුණු කර ගැනීමට ප්‍රජාව උනන්දුවෙන් සිටි නිසා ප්‍රාදේශීය සභා සමග සම්බන්ධ වී කටයුතු කිරීමට ඔවුහු කැමැත්තක් දැක්වූහ. නව ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය තම ප්‍රදේශයේ දේශපාලන නියෝජිතයන් සමග ගනුදෙනු කිරීම සඳහාත් තමන්ට පවත්නා ගැටලු ඉදිරිපත් කිරීම සඳහාත් පුරවැසියන්ට වැඩි ප්‍රවේශයක් සලසා දෙයි. ප්‍රාදේශීය සභා විසින් විවිධ වර්ගයේ බොහෝ සේවාවන් සම්පාදනය කෙරෙන අතර විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයට ඇතුළත් කිරීම සඳහා ප්‍රජාව විසින් ඒ අතරින් ප්‍රමුඛතා සේවා පහක් තෝරා ගැනිණ. එම සේවාවන් මෙසේ ය.

- ජල සම්පාදන සේවා
- කාණු පද්ධතිය
- කසළ ඉවත් කිරීම
- ප්‍රවේශ මාර්ග හා අතුරු මාර්ග
- වීථි අලෝක කිරීම
- ක්‍රීඩාංගණ
- පුස්තකාලය

මේවා අතරින් වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනුණේ ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් යොදා ගනිමිනි.

අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් ගත් කල ප්‍රජාව සමඟ එක් ව මුල පුරන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ ද්විතීය අධ්‍යාපනය ප්‍රමුඛතාවක් ලෙස හඳුනා ගන්නා ලදි.

## 1.5.5. කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම

දිස්ත්‍රික්ක තුනේ ප්‍රජා කණ්ඩායම් හා පළාත් පාලන බලධාරීන් සමග පැවැත්වූ උපදෙස් විමසීම් මාලාවකින් පසුව ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන සේවාවන්ට සම්බන්ධිතව විශේෂිත දර්ශක කට්ටලයක් හඳුනා ගන්නා ලදි. ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන සේවාවන් තක්සේරු කිරීම සඳහා පහත දැක්වෙන කාර්ය සාධන දර්ශක තෝරා ගන්නා ලදි:

| තෝරා ගත් ප්‍රාදේශීය සභා සේවා | දර්ශක |
|---|---|
| ජලය | • ගුණාත්මක බව<br>• ප්‍රමාණාත්මක බව<br>• නඩත්තුව<br>• සමස්ත තෘප්තිය |
| කසළ | • සේවා ආවරණය<br>• එක්රැස් කිරීමේ ක්‍රමය<br>• බැහැර කරන ක්‍රම |

| | |
|---|---|
| | • කලට වේලාවට එක්රැස් කිරීම<br>• සමස්ත තෘප්තිය |
| මාර්ග හා අතුරු මාර්ග | • වැසි දිනවල නඩත්තුව/අලුත්වැඩියාව<br>• නඩත්තු කටයුතුවල ගුණාත්මක බව<br>• මඩ වළවල්වලින් තොරව මාර්ග පවත්වා ගැනීම<br>• සමස්ත තෘප්තිය |
| වීථි ලාම්පු | • වීථි ලාම්පු සංඛ්‍යාව<br>• ඇණ හිටීම්වලට ප්‍රතිචාර දැක්වීම<br>• වීථි ලාම්පුවල තීව්‍රතාව/දීප්තිය<br>• සමස්ත තෘප්තිය |
| කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම් | • කාණු පිරිසිදු සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්මට ගත වන කාලය<br>• නඩත්තුව<br>• ඉදි කිරීම<br>• සමස්ත තෘප්තිය |
| ක්‍රීඩාංගණ | • ක්‍රීඩාංගණය වෙත ප්‍රවේශය<br>• ආරක්ෂක පියවර<br>• පිරිසිදුකම<br>• පවත්නා පහසුකම්<br>• සමස්ත තෘප්තිය |
| පුස්තකාලය | • විවෘත කෙරෙන වේලාව<br>• නඩත්තුව<br>• මෑත කාලීන ප්‍රකාශන පැවතීම<br>• පවත්නා පහසුකම් |

# අධ්‍යයන ප්‍රදේශය

**මොණරාගල දිස්ත්‍රික්කයේ** දී මෙම අධ්‍යයනය **බඩල්කුඹුර මැදගම හා මඩුල්ල** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය සභා සහ කලාප අධ්‍යාපන කාර්යාල යටතේ පවත්නා ප්‍රදේශ ගණනාවක් ආවරණය කරන බව පහත වගුවෙන් පෙනේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ප්‍රාදේශීය සභාව | ග්‍රාම නිලධාරි වසම්වල නම් | මුළු ගම්මාන සංඛ්‍යාව | කුටුම්බ සංඛ්‍යාව |
|---|---|---|---|
| මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ මඩුල්ල ප්‍රාදේශීය සභාව | නාමල්ඔය ජනපදය | 5 | 318 |
| | තල්කොටයාය | 2 | 229 |
| | රිටිගහවත්ත | 3 | 278 |
| | පංගුව | 3 | 286 |
| | පගුර | 4 | 213 |
| | කොල්ලදෙණිය | 12 | 412 |
| | මාගන්දාඔය ජනපදය | 4 | 248 |
| මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/මැදගම ප්‍රාදේශීය සභාව | රත්තනදෙණිය | 6 | 372 |
| | මැල්ලගම | 4 | 432 |
| | පිටදෙණිය | 4 | 296 |
| | බැදියාව | 4 | 408 |
| | කොටබෝව | 6 | 383 |
| | බිබිලමුල්ල | 3 | 328 |
| | ඇල්හේන | 2 | 280 |

| | | | |
|---|---|---|---|
| බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | මාළිගාතැන්න | 3 | 394 |
| | ඇල්ල | 4 | 305 |
| | කොටමුදුන | 5 | 410 |
| | ලුණුගල ජනපදය | 5 | 532 |
| | දේවතුර | 4 | 699 |
| | මියනකඳුර | 2 | 484 |

# 2. ප්‍රධාන සොයා ගැනීම්

## 2.1. සේවා ලබා ගැනීම, ප්‍රවේශය හා භාවිතය


මෙම විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය තෝරාගත් සේවා ක්ෂේත්‍ර හතක් එනම්, ජල සම්පාදන සේවාවන්, කාණු පද්ධතිය, කසළ එක්රැස් කිරීම, ප්‍රවේශ මාර්ග හා අතුරු මාර්ග, වීථි ආලෝක කිරීම, ක්‍රීඩාංගණ හා පුස්තකාල පහසුකම් යන තෝරා ගත් සේවාවන් වල පැවතීම හා භාවිතය පිළිබඳ දත්ත රැස් කරන ලදි. මින් පසුව එන කොටස් පිලිවෙලින්, 2018 පෙබරවාරි - සැප්තැම්බර් කාලය අතරතුර, සමීක්ෂණයට ලක් කරන ලද ඒ ඒ සේවා අංශය වෙත පවත්නා මහජන ප්‍රවේශය සාකච්ඡාවට ලක් කෙරෙයි. 2018 මැයි මාසයේ සිට සප්තැම්බර් මාසය දක්වා කාලය තුළ මෙම අංශයන්ගේ සිදු වූ ප්‍රගතිය මේ ආශ්‍රිතව විමසා බලනු ලැබේ. **පළමු සමීක්ෂණයේ** දත්තයන් **පළමු** (**Wave 1**) යන්නෙන් පෙන්නුම් කරයි. **දෙවන සමීක්ෂණයේ** දත්තයන් **දෙවන** (**Wave 2**) යන්නෙන් පෙන්නුම් කරෙන අතර මෙහිදී දෙවන සමීක්ෂණයේ ප්‍රතිඵල පළමු සමීක්ෂණයට සාපේක්ෂව විශ්ලේෂණය කෙරේ.

**පානීය ජලය**

**1 වැනි රූප සටහනෙහි** දැක්වෙන ආකාරයට, බඩල්කුඹුර හා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජල සම්පාදන සේවාවල සුළු වැඩිදියුණු කිරීමක් පෙන්නුම් කරයි. 2018 පෙබරවාරි මාසයේ පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් පසු තෝරා පත් කරගත් නියෝජිතයින්ගේ වැඩි දායකත්වය තුළින් සමහර දියුණු කිරීම් සිදු වී තිබේ. අනෙක් අතට, මැදගමේ ජල සැපයුම් සේවා සැපයුම සුළු වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කරයි. දෙවන සමීක්ෂණ කාලයේදී කොට්ඨාශයේ කුටුම්භ වලින් හතරෙන් එකකට පමණක් ජල සැපයුම් සේවා ලැබී තිබිණි. වැසි කාලවලදී, බොහෝ කුටුම්භයන් ඒවාට සතුව ඇති වෙනත් ජල ප්‍රභවයන් නිසා ප්‍රාදේශීය සභා වලින් බවුසර් මගින් සැපයෙන ජල නළ ජල සැපයුම හෝ නළ ජල සැපයුම මත රඳා නොසිටී.

ග්‍රාමීය ගෘහස්ථ ජල සම්පාදනය සාමාන්‍යයෙන් ව්‍යාපෘති අරමුදල් මගින් සිදු කරනු ලබන ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් සපයනු ලබන නිසා, ප්‍රාදේශීය සභා වලින් සපයනු ලබන නළ ජල සැපයුම ඉවත් කලහැක.


**1 වැනි රූප සටහන : ජලය පැවතීම හා භාවිතය**



## මාර්ග හා අතුරු මාර්ග

**2 වැනි රූප සටහනෙහි** දැක්වෙන පරිදි, බඩල්කුඹුර හා මැදගම ප්‍රදේශයේ ලේකම් කොට්ඨාශ වල කුටුම්භ සඳහා ප්‍රමාණවත් මාර්ග සහ අතුරු මාර්ග වලට ප්‍රවේශ වීමට ඇති හැකියාව පසුගිය මාස හතර තුළ සුළු වර්ධනයක් පෙන්නුම් කර තිබෙන අතර, දෙවන සමීක්ෂණ කාලය තුළදී 75%කට වඩා වැඩි කුටුම්භ ප්‍රමාණයක් ඔවුනට ප්‍රවේශය සඳහා අවශ්‍ය මාර්ග හා අතුරු මාර්ග සහිත බව වාර්තා කරන ලදී. 2018 පෙබරවාරි මාසයේ පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් පසු තෝරා පත් කරගත් නියෝජිතයින්ගේ වැඩි දායකත්වය තුළින් මෙම දියුණු කිරීම් සමහරක් සිදු වී තිබේ. කෙසේ වෙතත්, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාර්ග සහ අතුරු මාර්ග වල ප්‍රමාණවත් බව වාර්තා කරන කුටුම්භයන්ගේ ප්‍රතිශතයේ සැලකිය යුතු අඩු වීමක් දෙවැනි සමීක්ෂණයේදී දක්නට ලැබේ. ප්‍රදේශයේ බොහෝ මාර්ග තාර දමා නොමැති බැවින්, අධික වැසි කාලවල් වලදී මෙම මාර්ග මඩ වීම් හෝ පලුදු වීම් සිදුවන අතර, මාර්ග නිසිලෙස නඩත්තු නොකිරීම මෙකී තත්වය තවත් උග්‍ර කරයි.


**2 වැනි රූප සටහන : මාර්ග හා අතුරු මාර්ග පැවතීම හා භාවිතය**




## වීදි ලාම්පු

**3 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන ආකාරයට පසුගිය මාස හතර තුළ මැදගම හා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වීදි ආලෝකකරණ කටයුතු වර්ධනය වී ඇති බවයි.

**3 වැනි රූප සටහන : වීදි ලාම්පු පැවතීම**




විශේෂයෙන් මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වීදි ආලෝකකරණයේ සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරන අතර, වීදි පහන් ඇති කුටුම්භ ප්‍රතිශතය 59% වන අතර, මෙය ආසන්න ලෙස දෙගුණයක වර්ධනයකි. අනිත් අතට, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වීදි ආලෝකකරණයේ දී සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ. නිසි නඩත්තුවක් නොමැති බැවින්, අදාළ වීදි පහන් නිසිලෙස ක්‍රියාත්මක නොවීම මේ සඳහා හේතු වේ. එපමණක්ද නොව, සෑම නිවසකටම නිවස අසල වීදි ආලෝකයක් තිබිය යුතුයැයි අපේක්ෂා කලද වීදි ආලෝකකරණය සඳහා වෙන් කළ අයවැය මේ සඳහා ප්‍රමාණවත් නොවේ.

## කසළ එක්රැස් කිරීමේ සේවා

**4 වැනි රූප සටහනෙහි** දක්වා තිබෙන්නේ අධ්‍යන ප්‍රදේශය තුල කැලි කසළ එකතු කිරීමේ සේවාව පැවතීමේ ප්‍රමාණයයි. පළමු සමීක්ෂණයේදී සමස්තයක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ත්‍රිත්වයෙහි ඉතා කුඩා කුටුම්භ සංඛ්‍යාවක් (2%ක් හෝ ඊට අඩු) සඳහා පමණක් කසළ එකතු කිරීමේ සේවාව ලබා ගන්නා ලදී. දෙවන සමීක්ෂණයේදී බඩල්කුඹුර සහ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, දෙවන සමීක්ෂණය තුළදීත් මොණරාගල දිස්ත්‍රික්කයේ කසළ එකතු කිරීමේ සේවා ලබාගැනීමේ පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව තවමත් ඉතා අවම (5% හෝ ඊට අඩු) මට්ටමක පවතී.

**4 වැනි රූප සටහන : කසළ එක්රැස් කිරීමේ සේවාවන් පැවතීම හා භාවිතය**





කුණු කසළ එකතු කිරීමේ සේවාව සීමිත වීම සඳහා හේතුවක් ලෙස මෑතකදී නිකුත් කළ චක්‍රලේඛයේ පරිදි පර්චස් 20ට වැඩි භූමියක් හිමි නිවාස වලින් දිරාපත් වන කසළ එකතුකිරිම තහනම් කිරීම තේරුම් ගත යුතුය. බොහෝ ගම්බද කුටුම්භ වල පර්චස් 20 කට වඩා වැඩි ප්‍රමාණයක් ඇති බැවින්, මෙම කොට්ඨාශ තුළ ඇතැම් ප්‍රදේශවල කසළ එකතු කිරීම සිදු නොකෙරේ. ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි සේවය සැපයීම සඳහා අවශ්‍ය වන ට්‍රැක්ටර් වැනි සම්පත්වල හිඟකම පෙන්නුම් කර ඇත. ඇතැම් ගෘහස්ථයන් විසින් ඔවුන්ගේ උදුන් දැල්වීම සඳහා පොලිතින් සහ ප්ලාස්ටික් යොදා ගනී. ප්ලාස්ටික් දහනය නිසා හටගන්නා විෂදුම, සෞඛ්‍යට අහිතකර වන බැවින් නිසි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම යෝග්‍ය වේ.

## පුස්තකාල පහසුකම්

**5 වැනි රූප සටහන** මඟින් දැක්වෙන්නේ පුස්තකාල පහසුකම්වල යම් වැඩිදියුණු වීමක් සිදුවී ඇති බවය. නැතහොත්, අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහිම වැඩි කුටුම්භ ප්‍රමාණයකට පුස්තකාල පහසුකම් සඳහා ප්‍රවේශය ඇති හැකියාව දෙවන සමීක්ෂණ කාලයේදී වැඩි දියුණු වී ඇති බවයි. කෙසේ වෙතත්, පුස්තකාල පහසුකම් සඳහා ප්‍රවේශය සහිත කුටුම්භයන්ගේ ප්‍රමාණය සාමාන්‍යයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අඩු මට්ටමක පවතින අතර, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවම අගයක් පෙන්වයි.

බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වාර්තා වන්නේ 20% ක් පමණ වන පුස්තකාල පහසුකම් සහිත කුටුම්භ සංඛ්‍යාවක් වන අතර එය ඉහලම ප්‍රතිශත අගය වේ.


**5 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පැවතීම හා භාවිතය**




### කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම්

**6 වැනි රූප සටහනෙහි** දැක්වෙන ආකාරයට සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල ජලාපවහන පහසුකම්වල වැඩි දියුණුවීමක් දෙවැනි සමීක්ෂණ කාලය තුලදී දැකගත හැක.


**6 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පැවතීම හා භාවිතය**




### ක්‍රීඩාංගන

**7 වැනි රූප සටහන** මගින් දැක්වෙන පරිදි මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩාංගන පහසුකම් වැඩි වශයෙන් දියුණු වී ඇති අතර බඩල්කුඹුර සහ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දෙවැනි සමීක්ෂණ කාලය තුළදී එම පහසුකම අඩුවී ඇති බවයි.

**7 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පැවතීම හා භාවිතය**




**පොදු නිරීක්ෂණය**

ඉහත සඳහන් කළ පරිදි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනේ සේවා ලබා ගැනීම සඳහා ඇති අවකාශයේ සැලකිය යුතු වැඩිදියුණු කිරීම් පවතී. 2018 පෙබරවාරි මාසයේ පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් පසුව ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා තෝරා පත් කරගත් නියෝජිතයින්ගේ වැඩි සහභාගීත්වයක් ඇතිවීම හේතුවෙන් මෙම වැඩිදියුණු කිරීම් සිදු වී තිබෙනබව පැහැදිලිවේ.


## 2.2. සේවාවන් පිළිබඳ සමස්ත තෘප්තිය

මෙම සමීක්ෂණය ඉහත සාකච්ඡාවට ලක් කරන ලද තෝරා ගත් රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන්ගේ තෘප්තියේ මට්ටම් පිළිබඳ දත්ත ද රැස් කළේ ය. ඒ අනුව පහත සාකච්ඡා වලදී, **පළමු සමීක්ෂණය** ඇසුරෙන් ලබා ගන්නා ලද තොරතුරු වලට අදාළ දත්ත **පළමු** යන්නෙන් පෙන්නුම් කරනු ලබන අතර **දෙවන** යන්නෙන් පෙන්නුම් කරනු ලබන්නේ **දෙවන සමීක්ෂණය** තුලින් ලබා ගන්න ලද දත්තයන් වේ. එමෙන්ම පහත දැක්වෙන රූප සටහන මගින් පෙන්නුම් කරන්නේ අදාළ සේවාව පාරිභෝජනය සම්බන්ධයෙන් මහජනයා තුල පවතින ඉහළ තෘප්ති මට්ටමයි.

**ජලය**

**8 වැනි රූප සටහනෙන්** පෙන්නුම් කරන්නේ බඩල්කුඹුර සහ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජල සැපයුම් සේවා පිළිබඳව ඉහළ තෘප්තිමත් මට්ටමක් සහිත ප්‍රතිශතය අඩුවී ඇති බවය. මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෘප්තිමත් මට්ටම් යම් තරමකින් අඩු වී ඇති අතර දෙවන රැල්ලේ කිසිදු වර්ධනයක් දක්නට නොලැබේ. වැසි සමයේ දී ජලය සැපයෙන වෙනත් ජල ප්‍රභවයන් තිබෙන නිසා ප්‍රාදේශීය සභා විසින් සපයනු ලබන නළ ජල සැපයුම් භාවිතය අඩු කිරීම නිසා තෘප්තිමත් මට්ටම්වල පරිහානිය දක්වා ඇතිබව වටහා ගත යුතුය.


**8 වැනි රූප සටහන : ජල සම්පාදන සේවාවන් පිළිබඳ තෘප්තිය**




### මාර්ග හා අතුරු මාර්ග

මාර්ග හා අතුරු මාර්ග පිලිබඳ තෘප්තිමත්භාවය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහි සුළු වශයෙන් වර්ධනය වී ඇති අතර, මඩුල්ල ඉහළම වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය ප්‍රාදේශීය සභාව මඟින් සිදු කරන මාර්ග අලුත් වැඩියා කටයුතු හේතුවෙන් ඇතිවූවකි. එහෙත්, මෙම කොට්ඨාශවල පවත්නා මාර්ග යටිතල පහසුකම් පිළිබඳව සෑහීමකට පත්නොවන වාර්තාගත කුටුම්භවලින් 12% කට නොවැඩි සංඛ්‍යාවක් ඉහල තෘප්තිමත් මට්ටමක් පෙන්වීම මගින් ප්‍රකාශ කෙරේ.


**9 වැනි රූප සටහන : මාර්ග පිළිබඳ තෘප්තිය**




### වීදි ආලෝකය

**10 වැනි රූප සටහන** හි ඉදිරිපත් කර ඇති පරිදි දෙවන සමීක්ෂණ කාලය තුල විදී ආලෝකය පිලිබඳ තෘප්ති මට්ටම සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අඩුවී ඇති අතර, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මෙම සේවාව සම්බන්ධයෙන් අවම කුටුම්භ ප්‍රතිශතයක් ඉහල තෘප්ති මට්ටමක් දක්වයි.

**10 වැනි රූප සටහන : වීදි ආලෝකය පිළිබඳ තෘප්තිය**





මැදගම සහ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වැඩිදියුණු වීමක් දක්නට ලැබුණද, අඩු මට්ටමේ තෘප්තිමත් වීමට හේතු සාධක වන්නේ ගෘහස්ථයන් විසින් ලබා දී ඇති වීථි ලාම්පු ප්‍රමාණය, ඒවායේ ගුණාත්මකභාවය සහ නඩත්තුව පිළිබඳව සෑහීමකට පත් නොවන නිසාවෙනි. මේ සඳහා බලපෑ තවත් හේතුවක් වනුයේ නිවාස යාබදව වීදී ලාම්පු තිබිය යුතුයි යන ගෘහස්තයන්ගේ ඇති බලාපොරොත්තුවයි. සෑම නිවසකටම ඉදිරිපිට විදි පහන් සැපයිය නොහැකිය. ප්‍රාදේශීය සභා විසින් එම ප්‍රදේශවල වෙසෙන අය සඳහා වෙන් කරන ලද අයවැය මත වීථි ලාම්පු ලබා දීම සිදු කෙරේ.

## පුස්තකාල පහසුකම්

**11 වැනි රූප සටහන** මඟින් දැක්වෙන්නේ දෙවන සමීක්ෂණ කාලය තුල බඩල්කුඹුර හා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුස්තකාල පහසුකම් පිළිබඳ තෘප්තිමත්බව අඩු වී ඇති බවත්, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද කිසිදු වර්ධනයක් නොපෙන්වන අතර එහි කිසිදු කුටුම්භයකින් ඔවුන් සඳහා ඇති පුස්තකාල පහසුකම් පිළිබඳව ඉහල තෘප්ති මට්ටමක් දක්වන බව වාර්තා නොවිණි.

**11 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පිළිබඳ තෘප්තිය**





මෙය සපයන ලද පුස්තකාල සම්පත් වල ගුණාත්මකභාවය, ලබා ගත හැකිබව, ප්‍රයෝජනවත්භාවය සහ / හෝ අදාළ වන ගැටළු පිළිබිඹු වේ. සාමාන්‍යයෙන් අඩු මට්ටමේ තෘප්තිමත්භාවයට හේතුවක් ලෙස පුළුල් සම්පත් සහිත අනෙකුත් පුස්තකාල සේවා සමග සංසන්දනය කිරීම දැක්විය හැකිය.

කෙසේ වෙතත්, පුස්තකාල පහසුකම් සම්බන්ධව ඉහල තෘප්තිමත් මට්ටමේ අඩුවීමක් පවතින නමුත් දෙවන සමීක්ෂණ කාලය තුළ මධ්‍යස්ථ තෘප්තිමත් මට්ටම ඉහළ ගොස් තිබේ.

### ජලාපවහන පහසුකම්

බඩල්කුඹුර සහ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජලාපවහන පහසුකම් සම්බන්ධව තෘප්ති මට්ටම්වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත. කෙසේ වෙතත්, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, තෘප්තිමත් මට්ටම් ප්‍රමාණාත්මක ලෙස 44% සිට 9% දක්වා විශාල අඩු වී ඇති අතර, ඔවුන් දැඩි ලෙස සේවාව පිළිබඳව අතෘප්තිමත් බව වාර්තා කරයි. මෙම ප්‍රදේශය තුළ ඇති කාණු පද්ධතිය, වැසි සමයේදී අධික ජල ධාරිතාවක් හැසිරවීම සඳහා ප්‍රමාණවත් නොවීම මීට හේතුවයි. කාණු පද්ධතියේ දුර්වල නඩත්තු කිරීම මෙම ගැටලුව උග්‍ර කිරීමට හේතුවකි.


**12 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පිළිබඳ තෘප්තිය**




### ක්‍රීඩාංගන

13 වැනි රූප සටහනේ පරිදි ක්‍රීඩාංගන පහසුකම් වලට අදාලව තෘප්තිමත් මට්ටමේ සුළු වර්ධනයක් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙන්නුම් කරයි.

**13 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පිළිබඳ තෘප්තිය**



කෙසේ වෙතත්, ක්‍රීඩාංගන පහසුකම් පිළිබඳව ඉහළ තෘප්තිමත් මට්ටමක වාර්තාකළ මැදගම හා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් කිසිවකු සිටියේ නැත. අධික වැසි හා වැසි කාලවලදී නිසි ලෙස ක්‍රීඩාංගන නඩත්තු නොකිරීම හේතුවෙන් තෘප්තිමත් භාවය අඩු මට්ටමක පවතී. කෙසේ වෙතත්, ක්‍රීඩාපිටි පහසුකම් සම්බන්ධව තෘප්තිය ඉහළ මට්ටමක නොමැති වුවද, ප්‍රතිචාර දැක්වූ සැලකිය යුතු සංඛ්‍යාවක් දෙවැනි සමීක්ෂණය තුළ මධ්‍යස්ථ තෘප්ති මට්ටමක් ප්‍රකාශ කළ බව සැලකිය යුතුය.

**කැලි කසළ එක්රැස් කිරීම**


ග්‍රාම නිලධාරි වසම් බොහොමයක කසළ එක්රැස් කිරීමේ සේවාවන් ක්‍රියාත්මක වන්නේ සීමිත වශයෙන් බැවින් තෘප්තියේ මට්ටම් පිළිබඳව විශ්ලේෂණයක් කර නැත.

# 2.3. සැඟවුණු වියදම්[1]

## 2.3.1. සේවා සඳහා දරන ලද වියදම

සේවාවන් ලබා ගැනීම සඳහා මහජනතාවට දැරීමට සිදුව ඇති සැඟවුණු පිරිවැය පිළිබඳ සමීක්ෂණය මගින් සොයා බලනු ලැබීය. සැඟවුණු පිරිවැය / ගෙවීම් ස්වභාවය හා සිදුවීම් තේරුම් ගැනීම මෙම පිරිවැයේ නිත්‍යානුකූල බව හෝ අවශ්‍ය වුවහොත් නිශ්චය කිරීමට බලධාරීන්ට හැකි වේ.

**14 වැනි රූප සටහන : සේවාවන් ලබා ගන්නා විට දැරීමට සිදු වන සැඟවුණු වියදම්**




පළමු හා දෙවන සමීක්ෂණ දෙක අතරතුර, ප්‍රශ්නගත සේවාවන්ගෙන් බොහොමයක ජල සැපයුම් සේවා සඳහා අය කරනු ලබන ඔවුන් කල ගෙවීම පිළිබඳව පෙන්වා දී ඇත. (**14 වැනි රූප සටහන** බලන්න). දෙවැනි සමීක්ෂණයේදී, කසළ එකතු කිරීමේ සේවා, මාර්ග, ජලාපවහන පහසුකම්, පුස්තකාල පහසුකම්, ක්‍රීඩාංගන සහ වීදි ලාම්පු සඳහා ගාස්තු ගෙවීමක් සිදු කර ඇති බව කුටුම්භ සුළු සංඛ්‍යාවක් වාර්තා කර ඇත. පුස්තකාල


[1] ඍජුව නොපෙනෙන, වියදමක් නොවන එහෙත් වක්‍රාකාරයෙන් කළයුතු වියදම්

පහසුකම් සඳහා දැරූ පිරිවැය පුස්තකාල සාමාජිකත්ව ගාස්තු ලෙසත්, ක්‍රීඩාපිටි සඳහා වැය වන පිරිවැය විවිධ අවස්ථා සඳහා ක්‍රීඩාංගන පහසුකම් භාවිතා කිරීමට බලධාරීන්ට ගෙවන ලද ගාස්තු වේ. වීදි ලාම්පු සම්බන්ධව පිරිවැය ලෙස පොදු විදුලිය සැපයීම නොමැති විට නිවෙස්වල සිට අසල  වීදි ලාම්පු වෙත විදුලිය සැපයීම සඳහා සමහර නිවැසියන්ගේ ගෘහ විදුලි සැපයුම සම්බන්ධ කිරීම නිසා දරන්නට වූ පිරිවැය වේ. පාරවල් සමඟ සම්බන්ධිත පිරිවැය ලෙස, පාරවල් නඩත්තු සේවකයින්ට ආහාර සහ තේ පැන් ආදිය සැපයීම සඳහා ප්‍රජාව විසින් දරන ලද පිරිවැය ලෙස මෙය විස්තර කළ හැකිය. ජලාපවහන පහසුකම් සඳහා දැරීමට සිදුවූ පිරිවැය ලෙස, පොදු කාණු පද්ධතියට නිවාස සිට නල මාර්ග සම්බන්ධ කිරීම සඳහා වැයවූ පිරිවැය වේ. කෙසේ වෙතත්, සැඟවුනු / අතිරේක පිරිවැය පිළිබඳ ගැටළුව පිළිබඳව වඩාත් පැහැදිලි කර ගැනීම සඳහා, ප්‍රාදේශීය සභා විසින් ලබාදෙන කුමන සේවා කෙසේ පිරිවැයක් අන්තර්ගතවේදැයිද යන්න සොයාබැලීම වැදගත් වේ.

## 2.3.2. පැමිණිලි /දුක් ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීම

දෙවන සමීක්ෂණයේ දී බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුටුම්භ වලින් 41% ක් පමණ ඔවුන්ගේ පැමිණිලිවලට ප්‍රතිචාර ලැබී ඇති බව වාර්තාවේ. එසේම මඩුල්ල සහ මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කුටුම්භ වලින් තුනෙන් පංගුවකටද ප්‍රතිචාර ලැබී ඇතැයි වාර්තා විය. පැමිණිලි සහ දුක්ගැනවිලි සඳහා ලැබී ඇති ප්‍රතිචාර පිළිබඳ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දැක්වෙන්නේ ඉතාමත් අවම තෘප්ති මට්ටමකි. සමස්තයක් ලෙස, ඉහල හා මධ්‍යස්ථ තෘප්ති මට්ටම් වල අඩුවීමක් දෙවැනි සමීක්ෂණයේදී දක්නට ලැබුණි. 70% ආසන්න කුටුම්භ ප්‍රතිශතයක්, දුක් ගැනවිලි සහ පැමිණිලි පිළිබඳ ප්‍රතිචාර දැකීම පිළිබඳව අවම තෘප්ති මට්ටමක් දක්වයි.

**15 වැනි රූප සටහන : පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ තෘප්තිය**



# 3. සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය

**16 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන්නේ තමන් විසින් ප්‍රාදේශීය සභා වෙත සේවා පිළිබඳ කරන ලද පැමිණිලි හා ඉල්ලීම් වලට එම ආයතන වලින් ලැබුණු ප්‍රතිචාරයන් පිළිබඳ තෘප්ති මට්ටමයි. ඒ අනුව අධ්‍යනයේදී පෙනී යන්නේ ආයතන වෙතින් ලැබුණු ප්‍රතිචාර පිළිබඳව ඉතා ඉහල තෘප්ති මට්ටමට පත්වන පිරිස ප්‍රාදේශීය සභා බලප්‍රදේශ තුනෙහිම ඉතාම අඩු අගයක් වන බවයි. මෙම තත්වය තුලින් පෙන්නුම් කරන ඉතා වැදගත් තත්වයක් වන්නේ සේවා සපයන ආයතන හා නිලධාරීන් විසින් ජනතාවගේ ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීමත්, ක්‍රියාත්මක වීමත් ඉතා මන්දගාමීව සිදු වන බවයි.

උදාහරණයක් ලෙස **16 වැනි රූප සටහනේ** ඇති වර්ණ සංකේතවලින් පහත දැක්වෙන තත්ත්වය ඇඟවේ:

| **වර්ණය** | **බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ %** | **ගත යුතු පියවර** |
|---|---|---|
| රතු | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| කහ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| කොළ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

** තෘප්ති මට්ටම ගණනය කිරීම කරීම සඳහා ඉහල හා මධ්‍යයම යන මට්ටම දෙකම සැලකිල්ලට ගෙන ඇත.*

**16 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන පරිදි බොහෝ සේවා සැපයීමට අදාළ තෘප්ති මට්ටම දෙවන සමීක්ෂණ කාල සීමාවේදී රතු පාටින් වර්ණ ගන්වා තිබේ. ඇතැම් සේවා වල තෘප්ති මට්ටම සැලකියයුතු ලෙස ඉහල ගොස් ඇත. (එම තත්වය ඉහළට දක්වන ලද ඊතල සලකුණ ඇසුරෙන් හඳුනාගත හැකිය). කෙසේ වෙතත් ප්‍රාදේශීය සභා වෙතින් තව දුරටත් අවධානය යොමුකළ යුතු හා සංවර්ධනය විය යුතු සේවා මෙන්ම අංශයන් විශාල ප්‍රමාණයක් පවතින බව හඳුනාගත හැකිය.

**16 වැනි රූප සටහන : සේවාවන් පිළිබඳ තෘප්තිය ආශ්‍රිත ශ්‍රේණිගත කිරීම්**

| | ජලය | මාර්ග හා අතුරු මාර්ග | වීථි ලාම්පු | කාණු පද්ධතිය ආශ්‍රිත | ක්‍රීඩාංගණ | පුස්තකාලය |
|---|---|---|---|---|---|---|
| **දෙවැනි** | | | | | | |
| බඩල්කුඹුර | 19% ↓ | 45% | 32% | 39% ↓ | 11% ↓ | 28% ↓ |
| මැදගම | 32% | 37% | 42% | 10% | 9% | 14% |
| මඩුල්ල | 35% | 10% | 42% ↓ | 34% ↓ | 11% | 20% |
| **පළමු** | | | | | | |
| බඩල්කුඹුර | 28% | 11% | 0% | 56% | 12% | 41% |
| මැදගම | 11% | 6% | 29% | 0% | 3% | 0% |
| මඩුල්ල | 18% | 4% | 44% | 44% | 0% | 11% |

| | |
|---|---|
| (රතු) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%ට වඩා අඩු |
| (කහ) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%-60% අතර |
| (කොළ) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 60%ට වඩා වැඩි |

# 4. නිර්දේශ


## 4.1. වැඩි දියුණු කළ යුතු සේවා අංශ

### 4.1.1. වහා ම අවධානය යොමු කළ යුතු අංශ

විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් වහාම අවධානය යොමු කළ යුතු බවට ප්‍රතිචාර දක්වන්නන් විසින් හඳුනා ගැනුණු අංශ ගණනාවක් අනාවරණය විය. **17 වැනි රූප සටහන** තුළ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් අනුව මේවා සාරාංශ කර ඇත.


සමස්තයක් ලෙස මූලිකවම සංවර්ධනයට අවධානය යොමු කළයුතු අංශ ලෙස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුනෙන්ම දෙවන සමීක්ෂණ කාලය ඔස්සේ ඉස්මතුව පෙනෙන්නේ මාර්ග, පානීය ජලය, පුස්තකාල, ක්‍රීඩා පිට්ටනි, කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම් සහ වීථි ලාම්පු යන සේවාවන් ය

17 **වැනි රූප සටහන : ප්‍රාදේශීය සභාවන්ගේ වහා ම අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා සේවා**





**18, 19 හා 20 වැනි රූප සටහන්** මඟින් දෙවන සමීක්ෂණ කාලයේදී එක් එක් සභා ප්‍රදේශ වල තව දුරටත් සංවර්ධනය විය යුතු බවට ජනතාව ඉස්මතු කරන ලද සේවා අංශ පෙන්නුම් කරයි. බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග, වීථි ලාම්පු සහ ක්‍රීඩා පිට්ටනි යන්න මූලිකවම සංවර්ධනය විය යුතු අංශ ලෙස ඉස්මතු වී තිබෙන අතර, මැදගම ප්‍රදේශයේ ඉක්මනින් සංවර්ධනය විය යුතු අංශ ලෙස ඉස්මතුව තිබෙන්නේ මාර්ග, වීථි ලාම්පු සහ පුස්තකාල පහසුකම් යන්නයි. එමෙන්ම මඩුල්ල ප්‍රදේශයේ ඉක්මනින් සංවර්ධනය වියයුතු අංශ ලෙස මාර්ග, පානීය ජලය හා ක්‍රීඩා පිට්ටනි පහසුකම් හඳුනාගත හැකිය. මෙමගින් දක්වා තිබෙන ඉක්මනින් සංවර්ධනය කළයුතු අංශ වෙත ප්‍රාදේශීය සභාවන් විසින් ඊළඟ අයවැය සැකසීමේදී අවධානය හා ප්‍රමුඛත්වය ලබා දීම අවශ්‍ය වේ.


**18 වැනි රූප සටහන : බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු සේවා අංශ**




**19 වැනි රූප සටහන : මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු සේවා අංශ**



20 වන රූප සටහන : මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු සේවා අංශ




ප්‍රතිචාර දැක්වූවන් ප්‍රාදේශීය සභා විසින් කෙරෙන රාජ්‍ය සේවා සම්පාදනය සම්බන්ධයෙන් පොදුවේ අතෘප්තිමත් බව පෙන්නුම් කළ තැන්වල දී ඔවුන් අතෘප්තියට හේතු වශයෙන් හඳුනා ගත්තේ අවශ්‍ය පහසුකම් නොමැතිකම, පහසුකම් නඩත්තු නොකිරීම (පාරවල් හා ජලාපවහන පද්ධති අබලන් වීම, වීදි ලාම්පු නොමැතිකම යනාදිය) නිසා ආරක්ෂාව සම්බන්ධයෙන් මතු වන ගැටලු, පවත්නා පහසුකම් පිළිබඳව මහජනයා දැනුවත් නොකිරීම, පැමිණිලි සම්බන්ධයෙන් රජයේ නිලධාරීන්ගේ දක්වන දුර්වල ප්‍රතිචාරය සහ අදාළ බලධාරීන් නිසි නිරීක්ෂණයක් හෝ අධීක්ෂණයක් නොකිරීම වැනි කරුණු ය. ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිචාර දක්වන්නන් කළ යෝජනාවලින් අවධාරණය වූයේ නිසි සේවා සම්පාදනය සම්බන්ධයෙන් දේශපාලනඥයන් හා රජයේ නිලධාරීන් වඩාත් වග වීමේ අවශ්‍යතාව, සේවා සම්පාදනය වඩාත් හොඳින් සැලසුම් කෙරෙන හා නිරීක්ෂණය කෙරෙන බව සහතික කිරීමේ අවශ්‍යතාව, ගම් මට්ටමේ දී සේවාවන් පරිහරණය කරන්නන්ගෙන් උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාව සහ ප්‍රාදේශීය සභා විසින් සේවාවන් සම්පාදනය කෙරෙන බව ගැන මහජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාව යි.

එමෙන්ම ඇතැම් සේවාවන්ගේ සැලකිය යුතු මට්ටමින් මහජන තෘප්තිය ඉහළ යාමක් දක්නට නොලැබෙන අතර ඒ සඳහා විවිධ හේතු බලපෑ තිබේ. විශේෂයෙන්ම් එම කාල වකවානුව තුළ පැවති වර්ෂා අධික තත්වය විශේෂයෙන් මෙම තත්වය ට බලපා තිබේ. එමෙන් ම එම පහසුකම් වසර පුරාවටම ඉතා ගුණාත්මක මට්ටමකින් නඩත්තු කිරීමේ තත්වයන්ද තව දුරටත් ඉහල මට්ටමෙන් සිදු කිරීමේ අවශ්‍යතාවය ඉස්මතුව තිබේ.

## 4.1.2. වෙනත් සළකා බැලීම්

පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් අනතුරුව, දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණය දක්වා දෙන ලද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වලට සිය සේවා වැඩිදියුණු කිරීම සඳහා ලැබුණු ඉතා කෙටි කාලය (මාස හතරක පමණ) තුල වුවත් සැලකියයුතු මට්ටමක සාධනීය තත්වයක් හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේ දත්තවලට පළාත් පාලන සේවා අංශය තුළ ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් සැලසුම් කිරීම සඳහා සුදුසු අවම මට්ටමක් (විශේෂයෙන් ම **16 වැනි රූප සටහන** තුළ දක්වා ඇති ලකුණු ප්‍රමාණය) සම්පාදනය කළ හැකි ය.

පළාත් පාලන සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩු සහ ගැටලුකාරී තත්වයන් මෙම අධ්‍යයනය ඇසුරෙන් ඉස්මතු කෙරෙන අතර එම තත්වයන් විසඳීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සෙවීම අත්‍යාවශ්‍යය ය. මෙම

ඉක්මන් අවධානය යොමු කළ යුතු පළාත් පාලන සේවා අංශයන් අනාගතයේ පිළිබඳව ප්‍රාදේශීය සහා මට්ටමෙන් සැලසුම් සම්පාදනය කිරීමේදී වැඩි අවදානයක් යොමු කිරීම වැදගත් වනු ඇත.

ග්‍රාම නිලධාරි වසම් අතර සේවා සම්පාදනය සම්බන්ධයෙන් පුළුල් විවිධත්වයක් පවතින අතර ග්‍රාම නිලධාරි වසම් තුළ රාජ්‍ය සේවා සම්පාදනය සම්බන්ධයෙන් පවත්නා අසමානතාවන් අවම කළ හැක්කේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම සඳහා වඩාත් සමීපව විමසා බැලීම සුදුසු වේ.

## 4.2. ඉදිරි මාවත

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ දෙවන වටයට පෙර සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන හා දීර්ඝ කාලීන අරමුණු හඳුනා ගනිමින් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිණිස සේවා සම්පාදකයන් සහ සේවාලාභීන් අතර සාකච්ඡාවලට පහසුකම් සපයන ලදි. මොණරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සේවා සම්පාදනයට අදාළ ක්‍රියාකාරී සැලසුම් 1 ඇමුණුමේ දක්වා ඇත.

2018 වසරේ මැයි මාසයේ දී පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණ මූලික සොයාගැනීම් පදනම් කරගෙන ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ලැබිණ. මෙම සොයාගැනීම් පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, රජයේ අධ්‍යාපන පලාත් පාලන හා ප්‍රාදේශීය සභා ලේකම් වරුන්ටත් ප්‍රජා සාමාජිකයින්ටත් ඉදිරිපත් කරනු ලැබුවේ එම මූලික සොයා ගැනීම් ඉදිරිපත් කිරීම් වැඩසටහන් තුළිණි.

සේවා සපයන්නන් සහ සේවා භාවිත කරන්නන් යන කණ්ඩායම් අතර පවත්වන ලද සාකච්ඡා පදනම් කරගෙන මෙම ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කරන ලද අතර ඒ අනුව කෙටි කාලීනව හා දිගු කාලීනව වන සැලසුම් 2018 වසරේ ඔක්තෝම්බර් මාසයේ පැවැත්වෙන දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණයට පෙර සංවර්ධනය කළහැකි ඉලක්ක බවට පත් විය. විශේෂයෙන්ම මෙම ක්‍රියාකාරී සැලසුම් සිවිල් සංවිධාන නියෝජිතයන්ට සේවා ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමට උපකාරී විය.

දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණය සිදු කරනු ලැබූයේ 2018 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී ය. එහිදී පළමු සමීක්ෂණය ඇසුරෙන් හඳුනාගනු ලැබූ සහ අගය කරන ලද සේවාවන්ගේ ප්‍රගතිය විමසා බැලීම අපේක්ෂා කරන ලදී. පහත දැක්වෙන වර්ණ වෙනස්වීම් සටහන සේවාවන්ගේ තෘප්ති මට්ටම් වෙනස්වීම සහ අවධානය යොමුකළ යුතු අංශ පිළිබඳව විග්‍රහයක් සපයයි.

**15 වැනි රූප සටහන** මගින් **පළමු සමීක්ෂණය (පළමු)** සහ **දෙවන සමීක්ෂණය (දෙවන)** අතර සංසන්දනාත්මක විග්‍රහයක් දක්වයි. වර්ණ වෙනස්වීම මගින් පෙන්නුම් කරන්නේ පසුගිය මාස හතරක කාලසීමාව තුල අදාළ සේවාව පිළිබඳ තෘප්ති මට්ටමේ සිදු වූ වෙනස් විමයි.

| වර්ණය | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ % | ගත යුතු පියවර |
|---|---|---|
| රතු | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| කහ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| කොළ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

* *සේවා පාරිභෝජකයන්ගේ තෘප්තිමත් මට්ටම සැලකීමේ දී ඉතා ඉහළ තෘප්ති මට්ටම සහ සාමාන්‍ය තෘප්ති මට්ටම යන දෙකම සැළකිල්ලට ගෙන ඇත.*

විශේෂයෙන්ම අදාළ සේවාවේ තෘප්ති මට්ටමට අයත් වර්ණය වෙනස් වීම අනිවාර්ය සාධකයක් ලෙස මෙහිදී හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය නොවන අතර සේවාවට අදාලව වන ප්‍රතිශතකමය වෙනස්කම අදාළ සේවාවේ ප්‍රගතිය පෙන්වන දර්ශකයක් ලෙස යොදාගත හැකිය.

තෘප්ති මට්ටම ඉහළ යාම සඳහා පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් එම සොයා ගැනීම සහ ඒ පිළිබඳව සේවා සම්පාදකයන් අතර ඇති වූ දැනුවත්භාවය මෙන්ම සේවාවන්ගේ ගුණාත්මක බව වර්ධනය කිරීම පිළිබඳව ඇති වූ කථිකාව කිසියම් සාධනීය බලපෑමක් කර තිබේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය සේවා සම්පාදකයන් හට අදාළ ප්‍රදේශයන් වෙත සැපයෙන සේවාවන් සංවර්ධනය කිරීමටත්, ඒ අනුව සේවා පරිභෝජකයන් අතර තෘප්ති මට්ටම ඉහළ නැංවීමටත් උපකාරී වී තිබේ.

එම නිසා ප්‍රගතිය විමසා බැලෙන **16 වැනි රූප සටහන** අනුව පෙන්නුම් කරන ප්‍රතිඵල රාශියකි. එමඟින් සේවා භාවිත කරන්නන්, තමන් භාවිත කරන සේවාවන් හා ප්‍රතිචාරයන් පිළිබඳව තමන්ගේ තෘප්ති මට්ටමත්, අදාළ සේවා පිළිබඳ සේවා සම්පාදකයන්ගේ ක්‍රියාකාරිත්වයත්, සේවාවන්ගේ ගුණාත්මක බව පිළිබඳවත් සන්නිවේදනය කරයි. එමෙන්ම එය මහජනයා නියෝජනය කරන මහජන නියෝජිතයන්ට, පළමු සමීක්ෂණ කාලයත් දෙවන සමීක්ෂණ කාලයත් තුළ තමන්ගේ ඡන්ද බල ප්‍රදේශ වල සේවාවන්ගේ ගුණාත්මක බව වෙනස්වීම පිළිබඳව අවබෝධයක් ගැනිමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයටත් වැදගත් වේ.

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් යනු ප්‍රජා ප්‍රතිචාර පදනම් කර ගත් දර්ශකයන් නොහොත් මාර්ගෝපදේශයන් බවත් ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ වඩාත් සංකීර්ණ ගැටලු පැවතිය හැකි අංශ ඒවායින් පෙන්නුම් කෙරෙන බවත් සිත තබා ගනිමින් ගැටලු පවත්නා අංශ තව දුරටත් විමර්ශනය කිරීම සඳහා මෙම විද්‍යුත් පුරවැසි වාර්තාපතෙන් සම්පාදනය වන තොරතුරු යොදා ගත හැකි ය. මෙම ගැටලුවලට තුඩු දෙන හේතු අවබෝධ කර ගැනීම සඳහා වඩාත් පුළුල් හා ගැඹුරු විමසා බැලීමක් හා අධ්‍යයනයක් වුව ද සිදු කළ හැකි ය.

ඉලක්ක පියවරයන්ට මුල පිරීම සඳහා පහත දැක්වෙන පියවරයන් නිර්දේශ කළ හැකි යඃ

- විද්‍යුත් පුරවැසි වාර්තාපතේ ශ්‍රේණිගත කිරීම් පදනම් කර ගෙන සේවා කාර්ය සාධනය සම්බන්ධයෙන් විශේෂ දුර්වලතාවක් පෙන්නුම් කරන අංශ හඳුනා ගත හැකි ය,
- සේවාවන් වැඩි දියුණු කිරීම පිණිස සපුරාලීමට සිදු විය හැකි අඩුපාඩුකම් හඳුනා ගනිමින් ඵලදායක අධ්‍යාපන සේවා සම්පාදනයට බාධා කරන මූලික හේතු සාධක කවරේ දැයි විමසා බලන්න,
- අධ්‍යාපන සේවා සම්පාදනයේ අඩුපාඩුකම් මග හැරවීම සඳහා එකවර මැදිහත් වීම් ගණනාවක් කිරීමට සිදු විය හැකි ය,
- සේවා සම්පාදනය සම්බන්ධයෙන් පවත්නා අඩුපාඩුකම් මග හැරවූ පසු සේවාවන් පරිහරණය කරන්නන්ගේ තෘප්තියේ මට්ටම් පිළිබඳව පසු විපරමක යෙදීමටත් සේවා කාර්ය සාධනය අවම මට්ටම්වලින් ඉහළ මට්ටම් වැඩි දියුණු වී ඇත්දැයි තීරණය කිරීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

**ප්‍රතිචාර ඇමුණුම 1: ක්‍රියාකාරී සැලසුම්:**

**පුරවැසි වාර්තාපත් සමීක්ෂණය, ක්‍රියාකාරී සැලසුම්:- බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**

**ආවරණය වන වසම් - කොටමුදුන, දේවතුර, මීයෙනකඳුර, ඇල්ල, මාලිගාතැන්න, ලුණුගල ජනපදය**

| **අංක** | **මූලිකත්වය දියුතු සේවාව** | **කෙටිකාලීන/ දිගුකාලීන** | **වගකීම දරන්නේ කවිද යන වග** | **සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ** | **ආරම්භක දිනය** | **අවසන් දිනය** | **නිරීක්ෂණය/ මෙහෙයවීම** | **මාසික හමුව** |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | වීථි ලාම්පු (අලුත් වැඩියාව) | කෙටි කාලීන | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | පළාත් පාලන කාර්මික සේවා අංශය, විදුලිබල මණ්ඩලය | 2018 මැයි 20 | 2018 දෙසැම්බර් 31 | ප්‍රාදේශීය සභා ප්‍රධානියා, සිවිල් සමාජ සංවිධාන | 2018 ජුලි 20 |
| 02 | මාර්ග හා අතුරු මාර්ග (ඉදි කිරීම හා නඩත්තු කිරීම) | දිගු කාලීන හා කෙටිකාලීන | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව, පළාත් සභාව | 2018 මැයි 20 | 2020 වසර | ප්‍රාදේශීය සභා ප්‍රධානියා, සිවිල් සමාජ සංවිධාන | මාස තුනකට වරක් |
| 03 | පානීය ජලය (නල මාර්ග දීර්ඝ කිරීම හා ජලය පිරිපහදු කිරීම) | දිගු කාලීන | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව, ජලසම්පාදන මණ්ඩලය | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | 2018 මැයි 25 | 2020 වසර | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව, ජලසම්පාදන මණ්ඩලය, සිවිල් සමාජ සංවිධාන | මාස තුනකට වරක් |
| 04 | සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් | දිගු කාලීන | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා | 2018 මැයි මාසය | 2020 වසර | ප්‍රාදේශීය සභාව, සිවිල් සමාජ | මාස තුනකට වරක් |

**සැකසුම**

එස්.එච්.ඒ. චතුරිකා - ගරු ලේකම්, බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව
එම්.ඒ. ධම්මිකා - කොටමුදුන
ආර්.ඩබ්ලිව්. අශෝක විජේසිංහ - ඇල්ල
ජ්.එම්. සුපුන් ප්‍රියංකර- මාලිගාතැන්න
ජේ.එම් සෝමලතා - ලුණුගල ජනපදය
ආර්.එම්. ප්‍රේමතිලක - ලුණුගල ජනපදය
**දිනය 2018-05-10; ස්ථානය - සහකාර පළාත්පාලන කොමසාරිස් කාර්යාලය, මොණරාගල**

**පුරවැසි වාර්තාපත් සමීක්ෂණය, ක්‍රියාකාරී වැඩ සැලැස්ම - මැදගම ප්‍රාදේශීය සභාව**
**ආවරණය වන වසම් - රත්තනදෙණිය, බැදියාව, කොටබෝව, මැල්ලගම බිබිලමුල්ල, ඇල්හේන, පිටදෙණිය**

| අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කව්ද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | පානීය ජලය (පිරිපහදු) | දිගු කාලීන | අදාළ වසමේ ප්‍රාදේශීය මන්ත්‍රී තුමා සහ සිවිල් ප්‍රජාව | ඇමතිවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, ප්‍රජා සංවිධාන නිලධාරීන් | 2018 ජුනි මාසය | 2020 වසර | කාර්මික නිළධාරී මහතා, ප්‍රාදේශීය සභාව | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 02 | වීථි ලාම්පු | කෙටි කාලීන | සිවිල් සංවිධාන සහ ප්‍රාදේශීය සභාව | සිවිල් කාර්මික ශිල්පී, කාර්මික සහායක, විදුලි බල මණ්ඩලය | 2018 මැයි මාසය | 2018 දෙසැම්බර් මාසය | සිවිල් සංවිධාන | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 03 | සභාව සතු මාර්ග හා අතුරු මාර්ග | දිගු කාලීන | ග්‍රාමීය ප්‍රජා සංවිධාන සහ ප්‍රාදේශීය සභාව | සිවිල් සංවිධාන, ප්‍රාදේශීය සභාව, සිවිල් සංවිධාන, අදාළ වසමේ මන්ත්‍රී තුමා | 2018 මැයි මාසය | 2019 අගෝස්තු මාසය | සිවිල් සංවිධාන, ප්‍රාදේශීය සභාව, සිවිල් සංවිධාන, අදාළ වසමේ මන්ත්‍රී තුමා | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 04 | කුණු කසල කළමනාකරණය | කෙටි කාලීන | සිවිල් සංවිධාන, මහජන සෞඛ්‍ය පරීක්ෂක | මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා, අදාළ වසමේ රාජ්‍ය නිළධාරීන් | 2018 මැයි මාසය | 2019 වසර | මහජන පරීක්ෂකතුමා, ප්‍රජා පොලිස් සිවිල් සංවිධාන | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |

**සැකසුම -**

ආර්.එම්. ඒ. සෙනෙවිරත්න - ලේකම්, මැදගම ප්‍රාදේශීය සභාව
පද්මිනි නෙරංජලා - රත්තනදෙණිය
වසන්ති සංජීවනී - රත්තනදෙණිය
චන්දිමා ජීවන්ති - බැදියාව
චමෝදි උපේශිකා - පිටදෙණිය
ගයානි මධුවන්ති - පිටදෙණිය

**දිනය 2018-05-10; ස්ථානය - සහකාර පලාත්පාලන කොමසාරිස් කාර්යාලය, මොණරාගල**

## පුරවැසි වාර්තාපත් සමීක්ෂණය, ක්‍රියාකාරී වැඩ සැලැස්ම- මඩුල්ල ප්‍රාදේශීය සභාව

**ආවරණය වන වසම් - නාමල් ඔය ජනපදය, පඟුර, කොල්ලදෙණිය, රිටිගහවත්ත, පංගුව, තල්කොටයාය, මාගන්දාඹය ජනපදය**

| අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කවිද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | වීථි ලාම්පු | කෙටි කාලීන | මඩුල්ල ප්‍රාදේශීය සභා සභාපති හා ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව හා ප්‍රජාව | 2018 මැයි 10 | 2018 ඔක්තෝබර් 10 | ප්‍රාදේශීය සභාව හා සිවිල් සමාජ සංවිධාන | මාසයකට වරක් |
| 02 | මාර්ග හා අතුරු මාර්ග | දිගු කාලීන | මඩුල්ල ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව හා හා ප්‍රජාව | 2018 මැයි 10 | 2020 වසර | ප්‍රාදේශීය සභාව හා සිවිල් සමාජ සංවිධාන | මාසයකට වරක් |
| 03 | පානීය ජලය | දිගු කාලීන | මඩුල්ල ප්‍රාදේශීය සභාව සහ පළාත් සභාව | මඩුල්ල ප්‍රාදේශීය සභාව | 2018 මැයි 10 | 2020 වසර | ප්‍රාදේශීය සභාව හා සිවිල් සමාජ සංවිධාන | මාසයකට වරක් |
| 04 | කුණු කසල කළමනාකරණය | කෙටි කාලීන | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මඩුල්ල ප්‍රාදේශීය සභාව | 2018 මැයි 10 | 2018 ජුනි මාසය | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මාසයකට වරක් |
| 05 | කාණු පද්ධතිය | කෙටි කාලීන | මහජනතාව | මඩුල්ල ප්‍රාදේශීය සභාව | 2018 මැයි 10 | 2018 ජුනි මාසය | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මාසයකට වරක් |
| 06 | ක්‍රීඩා පිට්ටනි | දිගු කාලීන | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මඩුල්ල ප්‍රාදේශීය සභාව | 2018 මැයි 10 | 2018 ජුනි මාසය | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මාසයකට වරක් |
| 07 | පුස්තකාල | කෙටි කාලීන | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මඩුල්ල ප්‍රාදේශීය සභාව | 2018 මැයි 10 | 2018 ජුනි 10 | මඩුල්ල ප්‍රාදේශීය සභාව | මාසයකට වරක් |

**සැකසුම**

ඩී.එම්. චමින්ද පුෂ්පකුමාර, සභාපති - මඩුල්ල ප්‍රාදේශීය සභාව
එච්.එම්. චන්ද්‍රිකා හේරත් - නාමල්ඔය ජනපදය
එන්. චම්පිකා දමයන්ති - නාමල්ඔය ජනපදය
කේ.එම්. චන්ද්‍රපාල - රිටිගහවත්ත
කේ.එම්. පුෂ්පා කුමාරි - රිටිගහවත්ත
ආර් එම්. සමන්සිරි - මාගන්දාඹය ජනපදය

**දිනය 2018-05-10, ස්ථානය - සහකාර පළාත්පාලන කොමසාරිස් කාර්යාලය, මොණරාගල**

CEPA ආයතනය, යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත “සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම” ව්‍යාපෘතිය යටතේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් ගණනාවක විද්‍යුත් පුරවැසි වාර්තා පත් (eCRC) සමීක්ෂණ පැවැත්වීමේ කාර්යයට මුල පිරුවේ ය. විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණවල අභිමතාර්ථය වූයේ අධ්‍යයන ප්‍රදේශය තුළ

(i) ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය
(ii) ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය

යන ක්ෂේත්‍ර දෙකට අදාළව සේවාවන්හි ගුණාත්මක බව, සේවා සම්පාදකයන්ගේ වග වීම හා වැඩි දියුණු කළ යුතු අංශ තීරණය කිරීම යි. මෙම වාර්තාව සමාජීය වග වීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස විද්‍යුත් පුරවැසි වාර්තා පත යොදා ගැනීමේ අරමුණ ඇතිව පවත්වන ලද ප්‍රථම විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ සොයා ගැනීම් ඉදිරිපත් කරයි. දිස්ත්‍රික්ක තුන තුළ සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා වහා ම අවධානය යොමු කළ යුතු හා පියවර ගත යුතු යැයි ප්‍රතිචාර දැක්වූවන් විසින් හඳුනා ගන්නා ලද අංශ ගණනාවක් විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් අනාවරණය විය. විද්‍යුත් පුරවැසි වාර්තා සමීක්ෂණයේ ප්‍රාරම්භක සොයා ගැනීම් පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කෙරුණු අතර සේවා සම්පාදකයන් හා සේවාලාභීන් අතර සාකච්ඡා සඳහා පහසුකම් සපයනු ලැබිණ. මෙම වාර්තාව සම්පාදනය කර ඇත්තේ මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ප්‍රචලිත කිරීම පිණිස සහ අවශ්‍ය තැන්වල දී මෙහෙයුම් ප්‍රතිපත්ති වෙනුවෙන් අභිදේශනයේ යෙදීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ගැනීම පිණිස මෙම තොරතුරු යොදා ගැනීම සඳහා ය.




29, ආර්. ජී. සේනානායක මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 11 46902200, 2676955
ෆැක්ස් :+94 11 2676959
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk


cepa centre for poverty analysis

European Union
යුරෝපා සංගමය

ACTED

ISBN: 978-955-3628-39-8